www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩුබායිහි ඩොලර් බිලියන 59 ක නය පැහැර හැරීම ලෝක මූල්‍ය පද්ධතිය හරහා කම්පන තරංග නිකුත් කරයි

## Dubai's $59 billion default sends tremor through global financial system

ඇලෙක්ස් මැසෙන්ජර් විසිනි
2009 නොවැම්බර් 28

නාගරික පාලනය යටතේ ඇති රජය සතු විශාලතම සමාගම වන ඩුබායි වර්ල්ඩ් නිකුත් කල ඩොලර් බිලියන 59 ක බැඳුම්කරයන්ගේ කල් පිරෙන දිනය "අඩුම වශයෙන්" සය මසකින් ප්‍රමාද වන බවට 28 දින නිකුත් කල නිවේදනය, ගෝලීය කොටස් වෙලඳපොලවල් සී සී කඩ යැවීය. ඩුබායි හි දැවැන්ත නය පැහැර හැරීම කෙරෙහි වෙලඳපොලවල ප්‍රතිචාරය, ඩුබායි වර්ල්ඩ් හා එහි සංචාරක අංශය වන නැකීල් වෙත ආසියානු හා යුරෝපීය බැංකු වල නිරාවරනය වීම මඟින් පාර්ශවීය ලෙස ප්‍රකාශයට පත් විය.

කෙසේ වුවත් වැටීමේ සැබෑ හේතුව වූයේ, ලෝකය පුරා, විශේෂයෙන්ම මැද පෙරදිග හා නැගෙනහිර යුරෝපයේ, දැවැන්ත ලෙස නයගැතිව සිටින නයකාර ආන්ඩු නය පැහැර හැරීම පිලිබඳ අන්තරාය, ඩුබායිහි පෙනෙන්නට ඇති බංකොලොත්කම මඟින් නිරාවරනය වීමයි. එවන් පැහැර හැරීමක අර්ථය වනු ඇත්තේ, ආර්ථික කඩා වැටීමේ පසු භාගයේ තත්වයන් නිසා දැනටමත් පීඩාවට පත්ව සිටින එවන් රටවල මිලියන ගනන් කම්කරුවන් කබලෙන් ලිපට වැටීමක් පමනක් නොව, වඩාත් නරක අතට හැරිය හැකි ගෝලීය මූල්‍ය අර්බුදයේ දෙවන අදියර පිලිබඳ ඇඟවීමයි.

ප්‍රසිද්ධියට පත් කල බැන්ක් ඔෆ් ඇමරිකා නියමුවන්ගේ සටහනකින් ස්වෛරී රාජ්‍ය නය පැහැරහැරීමක් පිලිබඳව මෙසේ අනතුරු අඟවා ඇත. "2000 ගනන් මුල ආර්ජන්ටිනාව ද 1990 ගනන් අග රුසියාව ද සිදුකල ආකාරයටම මෙහිදී ද ප්‍රශ්නය, රාජ්‍ය පැහැර හැරීමක් දක්වා පැතිර යමින් ලෝකය පුරා නැගී එන වෙලඳපොලවල් තුල ප්‍රතිරාවය නැංවීම පිලිබඳ -- අග්ගිස්සේ අවදානම ලෙස -- කාරනය කිසිසේත්ම බැහැර කල නොහැකිය."

මූල්‍ය ක්ෂේත්‍රයට රාජ්‍යයේ මුක්කුව ලැබෙන නිසා 2008 සැප්තැම්බරයේ මෙන් මෙවර වෙලඳපොලවල කුලප්පුවක් හට නොගනු ඇතැයි පවසන අතරම 28 දා ෆිනෑන්ෂල් ටයිම්ස් කතුවැකිය සටහන් කලේ "බියපත් ආයෝජකයෝ රාජ්‍ය නය කෙතරම් සුරක්ෂිත දැයි කනස්සලුවී සිටිති." එය අයර්ලන්තය හා සයිප්‍රසය නිදසුන් දෙකක් ලෙස ගෙනහැර දක්වයි.

ඩුබායිහි දියවී යාම නියෝජනය කරන්නේ ගෝලීය නයගැති ප්‍රමානයෙන් සුලු කොටසක් පමනි. එහෙත් ගෝලීය අර්ථික ගොඩජ්මක් පිලිබඳ කථාන්තර මධ්‍යයේ එය ඇඟවුම් කරන්නේ, ලෝකය පිහි තුඩක රැඳී සිටින බවයි. බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන්ගේ සහතික දීමේ උත්සාහය ඇඟවුම් කරන්නේ, මූල්‍ය හා පාලක ප්‍රභූන් දැනටමත් බියපත්ව සිටින බවයි. 28 දා උදෑසන බ්‍රවුන්, ඩුබායි වෙතින් ගෝලීය ආර්ථිකයට එල්ල කෙරෙන අවදානම පිලිගෙන තිබුන ද, "මා සිතන්නේ පූර්වයෙන් අපට පොරබැදීමට සිදුවූ ගැටලු වල පරිමානයට මෙය ගමන් නොකරනු ඇති බවයි" යනුවෙන් තත්ත්වය ප්‍රවේශම් සහගතව අවතක්සේරු කලේය.

ඩුබායි අර්බුදය මුල්කරගෙන වෙලඳපොලවල ඇතිවූ වැටීම තියුනු ලෙස ප්‍රකාශයට පත් වූයේ ජපානයේ ය. මිට්සුබිෂි යූඑෆ්ජේ හා සෙමිටරෝ මිට්සුයි ඇතුලු ජපාන බැංකු ගනනාවක් කෙලින්ම හෝ වක්‍ර ලෙස ඊට නිරාවරනයවී තිබේ. 27 දින ජපාන කොටස් සියයට 3.2 න් හැකිලුනි. මෙය මාස 8 ක් තුල එක දිනක ඇතිවූ ලොකුම වැටීමයි. එදින ම ඕස්ට්‍රේලියාවේ සියයට 2.9 ක වැටීමෙන් පෙන්නුම් කලේ, එහි නාවික බඩු තොග වලින් තුනෙන් එකක්ම ගෙනයන්නේ ඩුබායි වර්ල්ඩ් හි නැව්බඩු ශාඛාවක් වීමේ කාරනයයි. නිව් යෝර්ක්හි කොටස් මිල දර්ශකය සියයට දෙකක පහත අගයකින් ආරම්භ වී ඉන් කොටසක් යලි පියවා ගත්තේය. ලංඩන් වෙලඳපොලෙහි ස්ටර්ලින් පවුම් බිලියන 44 ක් අතුගෑවී ගිය අතර එය, මාර්තු මාසයෙන් පසු සිදුවූ ලොකුම අලාභයයි. බ්‍රිතාන්‍යයේ එච්එස්බීසී බැංකුවේ කොටස් සියයට 7 න් වැටුනි. එය ඩුබායි සමාගමට ඩොලර් බිලියන 17 ක් නයට දී ඇති බව වාර්තා වෙයි. ඩුබායි අර්බුදයට නිරාවරනයවූ අනෙකුත් බ්‍රිතාන්‍ය බැංකු අතර ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ්, බ්‍රිතාන්‍ය සිටිගෲප්, ලොයිඩ්ස් හා රෝයල් බැන්ක් ඔෆ් ස්කොට්ලන්ඩ් ද විය. දැනට ආර්බීඑස් හි වැඩි පංගුවක් අයත් වන්නේ බ්‍රිතාන්‍ය රජයට ය. එය ලෝකයේ අන් කිසිදු බැංකුවකට වඩා (ඩොලර් බිලියන 67) ආන්ඩුවේ ඇප මුදල් ලබාගෙන තිබේ.

එක්සත් අරාබි එමීර් හි දේපල උත්පාතයක් ඇවිලවීම සඳහා ඩුබායි රජය සතු සමාගම් නයට ගෙන ඇති ඩොලර් බිලියන 80 න් හතරෙන් තුනක්ම ගෙන ඇත්තේ ඩුබායි වර්ල්ඩ් ය. 2008 ඔක්තෝබරයෙන් පසුව එලඹුනු සති වලදී දේපල වටිනාකම් අඩකින් පමන කැපී යෑමත් සමඟ උත්පාතය අවසානයකට පත්විය. උත්පාතය, ඩුබායි පාලක පවුල විසින් ලෝක ධනවතුන් සඳහා කාන්තාරයේ කෙලි බිමක් නිර්මානය කිරීම ද ඇතුලු අසීමිත ධනය පිලිබඳ ගෝලීය ප්‍රභූවේ උන්මාදය කෙබඳු දැයි පෙන්නුම් කිරීමකි. එහි කැපී පෙනුනු අංග නම්, ලෝකයේ උසම ගොඩනැගිල්ල, ස්කී (ලිස්සා යාමේ) ක්‍රීඩාව සඳහා යෝධ ගෘහස්ථ බැවුමක් හා ඉඳි ගස් හා තරු වල හැඩයෙන් යුත් විශාල කෘතීම දිවයින් පෙලකි. බිලියන ගනනාවක ඉදිකිරීමේ ව්‍යාපෘතීන් වලට අතගසා සිටි ඩුබායි වර්ල්ඩ්, ගෝලීය ප්‍රවාහනය, විශේෂයෙන්ම වරාය හා නාවික, විවිධාංගීකරනයට ද තම විදේශ නය යොදා ගත්තේය. එහි ශාඛාව මැදපෙරදිග විශාලතම වරාය නියාමකයා විය.

ඩුබායි අර්බුදයේ පරිමාව මාස ගනනක් තිස්සේම දකින්නට ලැබුනු තත්ත්වය තුල, ආන්ඩුවේ නය පැහැර හැරීමේ නිවේදනය මඟින් ගෝලීය වෙලඳපොලවල් නුසූදානමෙන් සසල කිරීම වනාහි, ලෝක මූල්‍ය පද්ධතියේ අරාජකත්වය හා අතාර්කිකත්වය පිලිබඳ පාපෝච්චාරනයකි. පෙනී යන පරිදි බැංකු සිතාගෙන සිටියේ, ඩීපී වර්ල්ඩ් හි නයට ඩුබායි ආන්ඩුවේ නොමැතිනම් තෙලින් පොහොසත් අබුඩාබි නම් එහි සහෝදර එමිරේටය කර ගසනු ඇති බවය. එහෙත් කිසිදු සහතිකයක් නොවීය. ඩුබායි වර්ල්ඩ් යනු ඩුබායි ආන්ඩුව සතුව පැවති සීමිත වගකීම් සහිත සමාගමකි. විදේශ ආයෝජකයන් ගලවා ගැනීමට අබුඩාබිය මැදිහත්වනු ඇති බවට පැවති බලාපොරොත්තුව සිහිනයක් පමනි.

ලෝකය පුරා කොටස් වෙලඳපොලවල වැටීමත් සමඟ, ඩුබායි නය පැහැර හැරීම ක්ෂනිකව බලපා ඇත්තේ ජාතික වශයෙන්, විශේෂයෙන් ම දුප්පත් රටවල් විසින්, කරන නය ගැනීම් වලදී රක්ෂන ගාස්තු ඉහල නැඟීම කෙරෙහිය. ආන්ඩුවල බැඳුම්කර නිකුතුව මත නය පැහැර හැරීමේ හිලව් (සීඩීඑස්) ගාස්තු එම පිරිවැය මඟින් නියෝජනය කෙරෙයි. විශේෂයෙන්ම ග්‍රීසියේ එම වියදම් අහස උසට නැගී ඇත. රාජ්‍ය නය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 130 ඉක්මවා ඇති ග්‍රීසිය සති ගනනක් ඇතුලත ඩුබායි දේශය අනුව යනු ඇතැයි බිය පලවී තිබේ. හංගේරියාවේ ද 25 දා සිට සීඩීඑස් පිරිවැය ඉහල නැගෙමින් තිබේ. මැලේසියාව, දකුනු කොරියාව හා කටාර් යන රටවල සීඩීඑස් මිල සියයට 11 න් පමන වැඩිවී තිබේ.

මෙම වර්ධනයන් කිසිසේත්ම පෙර නොදුටු දේ නොවේ. ඩුබායි නය පැහැර හැරීම, ලෝකය පුරා ස්වෛරී රාජ්‍යයන්ගේ නය මට්ටම් නමැති වෙඩි බෙහෙත් පෙට්ටියට දැමීමට සූදානම් කල, දැල්වෙන ගිනිකූරකි. ගෝලීය මූල්‍ය අර්බුදයට ධනේශ්වර ආයතන වෙතින් පලවූ ප්‍රධානතම ප්‍රතිචාරය වූයේ, පුද්ගලික ආයතනවල විස සහිත වත්කම් හා අඩමාන නය ගැනීම්, ඇපදීම්, සහතික හා අනෙකුත් පියවීමේ යාන්ත්‍රන හරහා රාජ්‍ය නය වලට පරිවර්තනය කිරීමයි. මූඩීස් නය වර්ගීකරන ආයතනයේ අලුත්ම ගනන් බැලීම් වලට අනුව, ලොව පුරා සියලුම ස්වෛරී රාජ්‍ය නය ප්‍රමානය 2007 හා 2010 අතර කාලය තුල සියයට 50 න් එනම්, ඩොලර් ට්‍රිලියන 15.3 දක්වා වැඩිවනු ඇත.

මෙසේ වේගයෙන් ඉහල නගින රාජ්‍ය නය කොතෙක් දැවැන්ත ද හා වේගවත් ද යත්, විරැකියාවෙන් ද පහත් වර්ධනයෙන් ද වෙලී සිටින නයකාර ආන්ඩු වලට කෙටි කාලයේදී හෝ දිගු කාලයේදී මෙම නය ගෙවා දැමීමට ඇත්තේ සුලු ඉඩක් පමනි. ඉහල යන පැහැර හැරීමේ අවදානම ('දිගු වලිගයක්' සහිත අවදානම ලෙස ද හඳුන්වන) පිලිබඳ අවබෝධය මුල්කොටගෙන නය ගැනීමේ වියදම් ඉහල යෑම නිසා නයගැති රටවල තත්ත්වය තව දුරටත් නරක අතට හැරෙනු ඇත. එවන් නය ගැනීම් සඳහා ලබාගත හැකි ගෝලීය සංචිත ද සිඳී යමින් තිබේ. ග්‍රීසිය, හංගේරියාව, ලැට්වියාව, එස්තෝනියාව හා තුර්කිය නිරීක්ෂනයට හසුවන ගෝලීය ලැයිස්තුවේ මුලටම සිටින අතර, රාජ්‍ය නය ඩොලර් ට්‍රිලියන 12 ක් වන එක්සත් ජනපදයේ නය පැහැර හැරීමේ හැකියාව ද අවසන් වශයෙන් මතුපිටට පැමින තිබේ. මේ පිලිබඳව එක්සත් ජනපදය හා කුඩා රාජ්‍යයන් අතර ඇති ප්‍රධාන වෙනස නම්, චීනය ද ඇතුලු එහි බැඳුම්කර හිමියන් එය "වැටෙන්නට තරම් ලොකු වැඩි" යයි සැලකීමය.

ඩුබායි නය පැහැර හැරීම මඟින්, ලෝක ආර්ථිකයේ හොඳින් කලමනාකරනය හා නියාමනය කල ජාතික පර්ශවයන්ට, මූල්‍ය අර්බුදයේ පශ්චාත් කම්පනයන්ගේ බලපෑම මඟ හැරිය හැකිය යන ඊනියා ප්‍රකාශවල ද පල්ල ගලවා ඇත. ආන්ඩුවේ හා ව්‍යාපාරික මාධ්‍ය කියා ඇත්තේ, නිදසුනක් ලෙස, ඕස්ට්‍රේලියාව එයට ඔරොත්තු දෙන බවයි. එහෙත්, ඩීපී වර්ල්ඩ් සතු දැනට ඩොලර් බිලියන 1.5 ක් හා රටේ යටිතල ව්‍යුහයෙන් සැලකිය යුතු කොටසක් වන ඕස්ට්‍රේලියානු වරායන්, මෑත අනාගතයේදීම විකුනා දැමීමට සිදුවනු ඇත. ආරම්භක වාර්තා පෙන්නුම් කලේ ඒ සඳහා දැඩි උනන්දුවක් දැල්වී නැති බවත් ගැනුම්කරුවන් සොයාගත නොහැකිවනු ඇති බවත්ය. දැනට, ගෝලීය වෙලඳමේ අවිනිශ්චිත අනාගතයක සංදර්භය තුල, දැඩි අවදානමක් සහිත වත්කමක් මත ඒ සා පරිමානයේ ආයෝජනයක් සඳහා අරමුදල් ඇති දේශීය සමාගම් ඇත්තේ අල්පයකි.


© www.wsws.org